# නූතනත්වය හමුවේ දේශීයත්වය රැකගත් වෛද්‍ය මධ්‍යස්ථානයක් පිළිබඳ විමර්ශනයක් (පොරමඩල ග්‍රාමය ඇසුරින්)

**වික්‍රමසිංහ වයි.පී.එම්.එස්.** [1]

කුරුණෑගල දිස්ත්‍රිකයෙහි අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොරමඩල ග්‍රාමයේ සමන්ති ජයවික්‍රම වෙදතුමිය පවත්වාගෙන යන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය, දේශීයත්වය රැක ගනිමින් පාරම්පරික උරුමයත් නූතන තාක්ෂණයත් සමඟ මුසු ව හුදෙක් අසරණයන්ට පිහිටක් මෙතුළින් සලසාලයි. මෙමගින් එහි පවතින ආයුර්වේද ක්‍රම පිළිබඳ හා දේශීය වෙදකම රෝග නිවාරණය සඳහා භාවිතයට ගන්නා ආකාරය අධ්‍යයනය කිරීම අරමුණු වේ. එහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. මෙය ආරම්භයේ වෛද්‍ය මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කරන අතර පසුකාලීන ව ආයුර්වේද රෝහලක් දක්වා පරිවර්තනය වේ. වර්තමානය වනවිට රෝගීන්ට භික්ෂූන් වහන්සේලාට නේවාසික ව ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පහසුකම් වෙන්කරයි. දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව රෝගීන් සඳහා " ශිරෝධාරා","නාඩි ස්වේද" වැනි සුවිශේෂී ආයුර්වේද උපකරණ මගින් ප්‍රතිකාර කරන අතර කල්වය, ගල් වංගෙඩිය, ගල් ඇඹරුම්ගල්, කෙන්ඩිය වැනි උපකරණ භාවිතයෙන් ප්‍රතිකාර කරයි. ආයුර්වේදයේ එන විරේචන, නස්න, වස්ති, රක්ත, මෝක්ෂණ ආදි ආවේණික ප්‍රතිකර්ම මගින් විවිධ රෝගී තත්ත්වයන්ට අනුව ප්‍රතිකර්ම කෙරේ. බටහිර වෛද්‍ය ප්‍රතිකාර පසුපස ගොස් අසරණ වූ බොහොමයක් සුව කළ නොහැකි රෝගීන් සඳහා මෙහි දී සහනයක් අත්කර දුන් ආකාරය සාකච්ඡාවේ දී දැන ගන්නට ලැබුණ කරුණකි. මෙම දේශීය වෙදකමෙහි සම්ප්‍රදායික කෙම් ක්‍රම, නිල ප්‍රතිකාර, කටු චිකිත්සාව, ස්වේද ක්‍රම ආදියෙන් රෝගියාගේ බාහිර හා අභ්‍යන්තරය සඳහා ප්‍රතිකාර කරනු ලබයි. බටහිර වෙදකමෙන් බාහිර ව මතුපිටින් තාවකාලික ව ප්‍රතිකාර කරන ක්‍රමයට එහා යමින් ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ දී රෝග නිධානය, රෝග මූලය සඳහා ම ප්‍රතිකාර කරමින් ලෙඩ රෝග සම්පූර්ණයෙන් ම සුවපත් කිරීම ආයුර්වේදයේ සුවිශේෂිතාවයකි. ඒ සඳහා ම භාවිත ඖෂධ, ප්‍රතිකර්ම, පිළිවෙත් බටහිර වෙදකමට සාපේක්ෂ ව වෙනස් ය. විශේෂයෙන් දේශීයත්වයට හානි නොවන අයුරින් තුලනාත්මකව නූතන බටහිර වෛද්‍ය ප්‍රතිකර්ම අවශ්‍ය ස්ථානයන්හි දී යොදා ගැනීම මෙහිලා කැපී පෙනෙයි. චීන කටු, රුධිර පීඩනය, අධික තරබාරුව වැනි නිරෝගී දිවියකට අවැසි ප්‍රතිකාර නූතන නවීන තාක්ෂණික වෛද්‍ය උපකරණ ඇසුරින් දේශියත්වයේ මූල බීජයන් සුරක්ෂා කරමින් නූතනත්වය දේශීය ආයුර්වේද විද්‍යාවට ආරෝපණය කරගත හැකි බව ද පසක් කරවයි. පොරමඩල ග්‍රාමයේ පිහිටි මෙම වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් අපගේ අස්පෘශ උරුමයන් අයත් ආයුර්වේද වෙදකම කාලීන අවශ්‍යතාවයන් මත නූතන තාක්ෂණය හා සමග මුසුව ගමටත් ඉන් පරිබාහිර සමාජයටත් සෙත සලසාලයි. මෙවන් තවමත් දේශීයත්වය රකින අපගේ අස්පෘශ උරුමයන් ලොවට නිරාවරණය කරමින් එහි පැවැත්ම තහවුරු කිරීම කාලීන අවශ්‍යතාවක් මෙන්ම වගකීමක් ද වන්නේ ය.

**ප්‍රමුඛ පද :** දේශියත්වය, පාරම්පරික, නූතනත්වය, ආයුර්වේදය, ප්‍රතිකාර

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. mindyasatsarni@gmail.com